සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
சமுர்த்தி அபிவிருத்தி திணைக்களம்
**Department of Samurdhi Development**
මුදල් අමාත්‍යාංශය
සමෘද්ධි , ගෘහ ආර්ථික , ක්ෂුද්‍ර මූල්‍ය , ස්වයං රැකියා හා ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය
நிதி அமைச்சு
சமுர்த்தி, வதிவிடப் பொருளாதார,நுண்நிதிய, சுயதொழில்,மற்றும் வியாபார அபிவிருத்தி இராஜாங்க அமைச்சு
Ministry of Finance
State Ministry of Samurdhi, Household Economy, Micro Finance, Self Employment and Business Development


| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இல / My No ... DSD/HO/IT/11/Electricity | ඔබේ අංකය / உமது இல / Your No ............................................. | දිනය / திகதி / Date ..2021.03.12.................. |

දිස්ත්‍රික් ලේකම් / දිස්ත්‍රික් සමෘද්ධි අතිරේක අධ්‍යක්ෂ ජනරාල්,

දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ,

ප්‍රාදේශීය ලේකම්,

සමෘද්ධි නියෝජ්‍ය අධ්‍යක්ෂ/ සමෘද්ධි සහකාර අධ්‍යක්ෂ,

සමෘද්ධි කළමනාකරුවන් හා සමෘද්ධි සංවර්ධන නිලධාරිවරුන් වෙත,

## විදුලිය නොමැති පවුල් සමීක්ෂණය හා විදුලි සබඳතාවය ලබාදීමේ ප්‍රගතිය ලබා ගැනිම

මුළු දිවයිනම ආවරණය කරමින් විදුලිය නොමැති පවුල් පිළිබඳව සමීක්ෂණය කොට එම තොරතුරු CRM මොඩියුලය තුළින් Online ආකාරයට ඇතුලත් කොට ඉතා කෙටි කාලයකින් ඉතාම සාර්ථකව එම සමීක්ෂණය සිදුකර අවසන් කිරීමට ඔබ සැම දැක් වූ සහයෝගය ඉතා අගය කොට සලකමි.

02. අප විසින් ලබාදුන් එම සමීක්ෂණ වාර්තා පදනම් කොට ගෙන විදුලිබල අමාත්‍යාංශය හා විදුලිබල මණ්ඩලය විදුලිය නොමැති පවුල් සඳහා නොමිලයේ විදුලිය ලබාදීමේ කාර්යය මේ වනවිටත් ආරම්භ කර ඇත.

03. මෙසේ නොමිලේ විදුලිය ලබාදීමේ කාර්යයේදී නිවසේ අභ්‍යන්තර විදුලි පරිපථ සකස් කිරීම හා විදුලිය සම්බන්ධතා ලබාදීමේ ප්‍රගතියද CRM මොඩියුලය තුළින්ම ලබා ගැනීමට අවශ්‍ය කටයුතු සකස් කර ඇත. විදුලිබල මණ්ඩලය විසින් ඉල්ලුම්කරුවන්ට විදුලිය ලබාදුන් පසු CRM මොඩියුලය යාවත්කාලීන කිරීම පහත පරිදි සිදුකළ යුතුය.

1. ඉල්ලුම්පත්‍ර ඇතුල් කිරීම සඳහා CRM පද්ධතියට පිවිසි ආකාරයට සමෘද්ධි බැංකුවේ පරිශීලක නාමය [User Name] z (බැංකුවේ නම) @samurdhi.lk හා දී ඇති මුරපදය [Password] භාවිතයෙන් CRM පද්ධතියට ඇතුල් වන්න.

2. “Electricity Application” click කරන්න. එවිට ඔබ කලාපයට අදාළ විදුලි ඉල්ලුම්කරුවන්ගේ නාම ලේඛනය දිස්වේ. එම ලේඛනයෙන් විදුලි සබඳතාවය ලබාදුන් පුද්ගලයා තෝරා නම ඉදිරියේ ඇති Edit

යන්න මත Click කරන්න. එවිට ඔබ විසින් ඇතුලත් කරන ලද තොරතුරු තිරයේ පෙන්නුම් කරන අතර, එම පිටුවේ අවසානයට විදුලි සබඳතාවය ලබාදීම පිළිබඳ තොරතුරු යාවත්කාලින කළයුතුය.

- නිවසේ අභ්‍යාන්තර විදුලි පරිපථ සකස් කර ඇත්නම් **"ඇත"**
- විදුලි සබඳතාවය සාර්ථකව ස්ථාපිත කර ඇත්නම් **"ඇත"** හා **ලබාදුන් දිනය** සඳහන් කරන්න.
- විදුලි සබඳතාවය ලබාදිය නොහැකි නම් **"නොහැකි"** බවද, ඒ සඳහා වන හේතුවද තෝරා Submit කරන්න.

3. Electricity Progress Report තුළින් ප්‍රගතිය පරීක්ෂා කළ හැකිය.

04. මෙම විදුලි ඉල්ලුම්පත CRM මොඩියුලයට ඇතුල් කිරීමේ කාර්යය සිදු කල පුද්ගලයාට එක් පෝරමයක් සඳහා රු.10/- ක් බැගින් සමෘද්ධි බැංකුව විසින් ගෙවිය යුතුය. එම මුදල වැය ගිණුම මිශ්‍ර වියදම් ගිණුමට හර කර මුදල් ගිණුමට බැර පත්‍රයක් මගින් බැර කර අදාළ නිලධාරියාට ගෙවිය යුතුය. ඒ ඒ බැංකුවේ විදුලිය නොමැති පවුල් පිළිබඳව සමීක්ෂණයට අදාලව CRM මොඩියුලයට ඇතුල් කර ඇති ඉල්ලුම්පත්‍ර සංඛ්‍යාව මත මෙම මුදල තීරණය වේ. ඒ ඒ පවුල වෙත විදුලි සබඳතාවය ලබාදුන් පසු විදුලිය ලබාදුන් බවට ප්‍රගතිය ඇතුලත් කිරිමද එම නිලධාරින්ගේ වගකීමක් වේ.

05. මෙම කටයුතු සාර්ථක කර ගැනීමට ඔබ දක්වන සහයෝගය ඉතා අගය කොට සලකමි.

ආර්.පී.බී.තිලකසිරි,
සමෘද්ධි අධ්‍යක්ෂ ජනරාල්,

පිටපත් -

1. ලේකම් , සමෘද්ධි, ගෘහ ආර්ථික, ක්ෂුද්‍ර මූල්‍ය, ස්වයං රැකියා හා ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය- කා.දැ.ගැ.ස
2. ලේකම්, විදුලිබල අමාත්‍යාංශය - කා.දැ.ගැ.ස
3. අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මූල්‍ය) - සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව - දැ.ගැ.ස හා අ.ක.ස